මගේ අංකය - ජේඑස්සී/ඊඒ/ස්ථානමාරු 2021

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
සිවිල් අභියාචනා මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
දිසා විනිශ්චයකාරවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් හා අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්,

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ) වාර්ෂික ස්ථානමාරු - 2021**

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඌ. (1) (ආ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව සහ 2016.08.15 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා තීරණය පරිදි සිදු කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරී සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරී) වාර්ෂික ස්ථානමාරු නියෝග මේ සමඟ අමුණා ඇති **ඇමුණුම- A** (Annexure -A) හි සඳහන් වේ.

*** උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරී සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරී) වාර්ෂික ස්ථානමාරු 2021 අප්‍රේල් 01 වෙනි දින සිට ක්‍රියාත්මක වේ.**

02. මෙම ස්ථානමාරු ලබා දීමේදී අධිකරණ සේවා කොමිෂන් සභාවේ ස්ථාන මාරු උපදෙස් නියමිත පරිදි අනුගමනය කරමින් 2020.07.02 හා 2020.07.14 දරණ ලිපි අනුව වර්තමාන සේවා ස්ථානයේ වසර 04 සම්පූර්ණ කරන ලද එක් එක් සේවාවන්ට අයත් නිලධාරීන් විසින් එවන ලද ස්ථාන මාරු අයදුම්පත්හි කැමති ස්ථාන ලෙස නිලධාරීන් විසින් නම් කරන ලද ස්ථාන තුනෙන් (03) එකක් ලබා දී ඇත. කැමති ස්ථාන තුනෙන් එකක් ප්‍රායෝගිකව ලබාදිය නොහැකි අවස්ථාවලදී පමණක් නිලධාරීන් පදිංචි ස්ථානයන්ට සාපේක්ෂව ආසන්නතම වෙනත් සේවා ස්ථානයක් ලබා දී ඇත.

03. තවද නියමිත කාල සීමාව සම්පූර්ණ කර ඇති වුව ද, ඉහත 2020.07.02 හා 2020.07.14 දින දරණ ලිපි වල සඳහන් උපදෙස් පරිදි අයදුම්පත් ඉදිරිපත් නොකල නිලධාරීන්ටද සේවා අවශ්‍යතාවය මත ලබා දී ඇති ස්ථාන මාරුද ඉහත ලේඛනයේ සඳහන් වන අතර වසර හතරක (04) ක සේවා කාලයක් සම්පූර්ණ කර මේ අවස්ථාවේ දී ස්ථාන මාරු ලබා දී නොමැති නිලධාරීන් ඉදිරි කාලයේදී සේවා අවශ්‍යතාවය මත සිදු කිරීමට යෙදෙන ස්ථාන මාරු සඳහා ප්‍රමුඛත්වය ලබනු ඇත.

04. සුදුසු අනුප්‍රාප්තිකයන් නොමැති වීමේ හේතුව මත නියමිත කාලයට වැඩි කාලයක් වර්තමාන සේවා ස්ථානයන්හි (දුරබැහැර සේවා ස්ථානයන්හි) සේවය කරන ලද නිලධාරීන්ට වුවද පහසු සේවා ස්ථානයන්ට ස්ථාන මාරු ලබා දී නොමැති විය හැකිය. එවැනි ඉල්ලීම් අනුප්‍රාප්තිකයින් ලද විට වහාම ඉටු කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සටහන් කර ගනු ලැබ ඇත.

05. දැනට සේවය කරනු ලබන ස්ථානයේ වසර හතරක (04) ක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට මෙම වාර්ෂික ස්ථානමාරු වෙනුවෙන් ගමන් වියදම් හිමිකම් ලැබෙන්නේ එම නිලධාරීන්ගේ ඉල්ලීමකින් තොරව සේවා අවශ්‍යතාවය මත අදාල ස්ථාන මාරු නියෝග කර ඇත්නම් පමණි. දැනට සේවය කරනු ලබන ස්ථානයන්හි වසර හතරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින්ට ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව ගමන් වියදම් සඳහා හිමිකම් ලැබේ.

06. මෙම ස්ථාන මාරු නියෝග නිලධාරීන්ගේ ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් සහ උපලේඛනගත සේවයේ කාර්ය මණ්ඩලය ඒ ඒ අධිකරණයන්හි සේවා අවශ්‍යතාවයන් මත බෙදී යන පරිදි සිදු කරනු ලැබ ඇති හෙයින් නියමිත පරිදි නිලධාරින් මුදා හැරිම සිදු කරනු නොලැබුවහොත් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිදු කරන ලද මානව සම්පත් කළමනාකරණ සැලසුම් කිරීම ක්‍රියාත්මක නොවන හෙයින් සියලුම ස්ථාන මාරු නියෝග මත මුදා හැරීම් සිදු කළ යුතුව ඇත. මෙම ස්ථාන මාරු නියෝග එපරිද්දෙන් ක්‍රියාත්මක නොකිරීමෙන් ඇති විය හැකි අයහපත් ප්‍රතිඵල පිළිබඳ වගකීම ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුව තිබූ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පැවරෙන බව මෙයින් අවධාරණය කෙරේ. මේ සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 27 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ. <u>එමෙන්ම නැවත නියමයක් කරනු ලබන තෙක් වාර්ෂික ස්ථාන</u>

මාරුවීම් අත්හිටුවා ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් නැවත නියමයක් කරනු ලබන තෙක් අදාල නිලධාරීන් මුදා නොහැරිය යුතුය.

07. තවද නඩු භාණ්ඩ භාරකරුවන් වශයෙන් ක්‍රියා කරන නිලධාරීන් ස්ථාන මාරුවී යාමට ප්‍රථම අවසන් කළ යුතු කටයුතු නොපමාව අවසන් කළ යුතු බවද එම කටයුතු සඳහා ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වීමෙන් පසු නැවත අනුයුක්ත කිරීමක් සිදු නොකරන බවද කොමිෂන් සභාවේ නියමය පරිදි දැනුම් දෙනු ලැබේ. එවැනි නිලධාරීන් ද ඉහත 06 ඡේදයේ පරිදි මුදා හැරිය යුතු වේ. අදාල නිලධාරීන් මුදා හරිමින් නිකුත් කරන ලද ලිපියේ පිටපතක් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත යොමු කිරීමේදී එකී ලිපියේ දකුණු පස ඉහළ කෙළවරේ ඒ ඒ නිලධාරීන්ගේ පත්වීම් ලිපියේ සඳහන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ යොමු අංකය සඳහන් කළ යුතුය.

උදා යොමු අංකය EA/PF/3……………..

08. මෙම ස්ථාන මාරු නියෝග පරිදි අධිකරණයෙන් මුදා හැරීමට නියමිත සියලුම නිලධාරීන් නියමිත දිනට මුදා හැරීමට කටයුතු කරන බවට මෙයට අමුණා ඇති ආකෘති පත්‍රය (ආකෘතිය - I) මගින් දන්වන්න.

09. ඉල්ලා ඇති අධිකරණ තුනෙන් එකකට හෝ ස්ථාන මාරු ලැබී ඇති නිලධාරීන් නැවත අභියාචනා ඉදිරිපත් නොකල යුතු අතර එලෙස අභියාචනා ඉදිරිපත් කළද සළකා බලනු නොලැබේ.

10. වසර 04 සම්පූර්ණ නොවූ නමුත් ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කරන ලද නිලධාරීන්ගේ අයදුම්පත් හැකි තරම්දුරට සළකා බලා මෙම ස්ථාන මාරු ලැයිස්තුව සකසා ඇති බව අවධාරණය කරනු ලැබේ.

11. වාර්ෂික ස්ථාන මාරු අභියාචනා 2021.02.25 දින දක්වා භාර ගනු ලබන අතර, ඒ අනුව අදාල අභියාචනා පහත දක්වා ඇති ආකෘති පත්‍රය (ආකෘතිය - II) පරිදි ෆැක්ස් මගින් 0112 446111 දරණ ෆැක්ස් අංකය වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු අතර ස්ථාන මාරු අභියාචනයේ දෘඩ පිටපත් තැපැල් මගින් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාල වෙත එවීමට කටයුතු කළ යුතුය.

12. එක් එක් අධිකරණයෙන් වාර්ෂික ස්ථාන මාරු අභියාචනා ඉදිරිපත් කරන ලද නිලධාරීන්ගේ නම් ඇතුලත් කරමින් සකස් කරන ලද ලැයිස්තුවක් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් 2021.02.25 දින හෝ ඊට පෙර අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත එවීමට කටයුතු කළ යුතුය .

13. මෙම ස්ථාන මාරුවීම් හේතුවෙන් අධිකරණ රෙජිස්ට්‍රාර්, අධිකරණ ලිපිකරු සහ අධිකරණ ලඝු ලේඛක සේවාවන් හි ඇතිවන පුරප්පාඩු නව බඳවා ගැනීම් මගින් කඩිනමින් පිරවීමට කටයුතු කරනු ලැබේ.

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

2021 පෙබරවාරි මස 15 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදිය.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

**ආකෘතිය - I**

අධිකරණයේ නම …..................................................................

**<u>2021 - වාර්ෂික ස්ථානමාරු ලැබූ නිලධාරීන්</u>**

1. අධිකරණ රෙජිස්ට්‍රාර්
2. අධිකරණ පවුල් උපදේශක
3. වැඩසටහන් සහකාර,ගිණුම් සහකාර, සංවර්ධන නිලධාරී සේවය
4. අධිකරණ භාෂණ පරිවර්තක
5. අධිකරණ ලිපිකරු
6. අධිකරණ ලඝු ලේඛක
7. අධිකරණ යතුරු ලේඛක
8. අධිකරණ පොත් බැඳුම්කරු

ඉහත සඳහන් නිලධාරීන් 2021.04.01 දින සිට ස්ථාන මාරු අනුව නව සේවා ස්ථානවල සේවය කිරීමට හැකි වන පරිදි මෙම අධිකරණයෙන් මුදා හරිනු ලබන බව මෙයින් දන්වමි.

පරීක්ෂා කර බලන ලදි

රෙජිස්ට්‍රාර්ගේ නම

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
නිල මුද්‍රාව

දිනය

ආකෘතිය - II

| පෞද්. ලිපි ගොනු අංකය: EA/PF/...... |
|---|

අධිකරණයේ නම: .......................................................

තනතුර: ......................................................................

**දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින්,**
**ලේකම්,**
**අධිකරණ සේවා කොමිෂන් සභාව**

**2021 වාර්ෂික ස්ථානමාරු පිළිබඳ අභියාචනා**

| නම/<br>තනතුර /<br>ශ්‍රේණිය/<br>වර්තමාන සේවා ස්ථානය | ලිපිනය | වර්තමාන සේවා ස්ථානයට වාර්තා කර ඇති දිනය | අයදුම් කරන ලද සේවා ස්ථාන * | ස්ථාන මාරුවීම් ලද සේවා ස්ථානය | ස්ථාන මාරු අයදුම් පතෙහි සඳහන් නොකරන ලද ස්ථානයකට ස්ථාන මාරුවක් අපේක්ෂා කරන්නේ නම්, එසේ අපේක්ෂා කරන අධිකරණ (03) |
|---|---|---|---|---|---|
| | | | | | |

* ස්ථාන මාරු අයදුම් පතෙහි සඳහන් කරන ලද 'ඉල්ලා සිටින ස්ථාන' එම අනුපිළිවෙලටම මෙහි සඳහන් කළ යුතුය. (එලෙස නිවැරදිව සඳහන් කරන ලද බවට රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කළ යුතුය.)

** විශේෂිත කරුණු (කරුණු වෙන් වෙන් වශයෙන් දක්වා එවිය යුතු අතර ලිපි අමුණා නොඑවිය යුතුය)

1.

2.

3.

(සැ.යු:- විශේෂිත කරුණු යටතේ රෝග පිළිබඳ සඳහන් කරන්නේ නම් වෛද්‍ය මණ්ඩල නිර්දේශ/වෛද්‍ය වාර්තාවල පිටපත් අමුණා එවිය යුතුය. ඔබ හෝ ඔබේ පවුලේ කෙනෙකු හෝ සම්බන්ධ නීති කෘත්‍යයක් තිබේ ද? එසේ නම් එහි නඩු අංකය, ස්වභාවය, පාර්ශවකරුවෙක්ද, සාක්ෂිකරුවෙක්ද යන වග හා එය පවතින අධිකරණය, කලත්‍රයා අධිකරණයක සේවය කරයි නම් කලත්‍රයාගේ නම, තනතුර හා සේවය කරනු ලබන අධිකරණය සඳහන් කළ යුතු අතර කලත්‍රයාට ස්ථාන මාරුවක් ලැබී ඇත්නම් නව සේවා ස්ථානය ද සඳහන් කරන්න.)

.................................

අයදුම්කරුගේ අත්සන

**රෙජිස්ට්‍රාර්ගේ නිර්දේශය:**

නිලධාරියා විසින් අභියාචනයෙහි සඳහන් කර ඇති කරුණු මා විසින් පෞද්ගලිකව ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව පරීක්ෂා කර නිවැරදි බව තහවුරු කර ගන්නා ලදී.

ඊට අමතරව පහත කරුණු ද අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානයට යොමු කළ යුතු බව ගෞරවයෙන් යෝජනා කරමි. (විශේෂ අපහසුතා පවතීද යනාදිය)

1.

2.

.............................................

ප්‍රධාන රෙජිස්ට්‍රාර්ගේ අත්සන හා
නිල මුද්‍රාව

දිනය: ...............................

<u>**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**</u>

ඉහත ප්‍රධාන රෙජිස්ට්‍රාර් විසින් ඉදිරිපත් කර ඇති කරුණු සහ පහත සඳහන් කරුණු අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානයට ලක් කර අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව නිලධරයාගේ ඉල්ලීම නිර්දේශ කරමි/ නොකරමි.

1.

2.

............................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
නිල මුද්‍රාව

දිනය: ...............................